## 17. ශීර්ෂය 17 - පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය

----------------------------------------------------------------------------------------------------

### 17.1 විගණන විෂය පථය

--------------------

පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 14 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 17.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 17.3 විගණන නිරීක්ෂණය

--------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය වාර්තා හා පොත් අනුව විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 17.4 සිට 17.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) විගණන විමසුම්වලට පිළිතුරු දීම

------------------------------------

කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2014 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

**--------------------**

වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එකතුව රු.138,629 ක් වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 ත් සියයට 16 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**17.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------**

**17.4.1 අභ්‍යන්තර විගණනය**

--------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**17.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**--------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා තිබුණි.

**17.5 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |

--------------------------------

| | | |
|---|---|---|
| (i) VII වන පරිච්ඡේදයේ 9.3 වගන්තිය | - | 2004 වර්ෂයේ සිට වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව වැටුප් වර්ධක 10 ක් සියළුම නිලධාරීන්ට ලබා දී තිබුණි. |
| (ii) XXI වන පරිච්ඡේදය | 42,000 | නිල ඇඳුම් දීමනා හිමි නිලධාරීන්ට අමතරව මාණ්ඩලික නොවන නිලධාරීන් 07 දෙනෙකු සඳහාද නිල ඇඳුම් දීමනාව ලබා දී තිබුණි. |

(ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**---------------------------**

| | | |
|---|---|---|
| (i) 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (i) දරන චක්‍රලේඛයේ 02ඡේදය | | නිලධාරීන් 05 දෙනෙකු පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි. |
| 03 ඡේදය | | කාර්යාලයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසළකා සෑම කාර්යාලයකම ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 2013 අප්‍රේල් 22 දිනැති අංක 05/2013 දරන චක්‍රලේඛයේ 02 (අ) වගන්තිය | 22,000 | නිල ඇඳුම් හිමි නිලධාරීන්ට චක්‍රලේඛය අනුව හිමි ප්‍රමාණය ඉක්මවා ගෙවීම් සිදු කර තිබුණි. |

**17.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

සභානායක කාර්යාලයේ දීප ව්‍යාප්ත සේවාවන් වන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හා ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සේවය කර තිබූ අතර එම නිලධාරීන්ට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට ලබාදුන් වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව අවස්ථා 4 කදී වැටුප් වර්ධක 10 ක්ද ලබා දී තිබුණි. මෙම නිලධාරීන් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයෙන් බැහැරව වෙනත් දෙපාර්තමේන්තු හෝ අමාත්‍යාංශවලට ස්ථාන මාරුවීම් ලබන අවස්ථාවකදී එම ආයතනවල සේවයේ නියුතු සමාන්තර සේවාවල අනෙකුත් නිලධාරීන්ගේ වැටුප සමග විෂමතාවයක් ඇති විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

**17.7 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**-----------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 10 | 08 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 11 | 03 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 03 | 03 | - |
| | **එකතුව** | **31** | **26** | **05** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 05 ක් පිරවීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.